ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අති විශෙෂ

අංක 2429/04 - 2025 මාර්තු මස 24 වැනි සඳුදා - 2025.03.24

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# III වැනි කොටස - ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීම

*මගේ යොමු අංකය*: WAN/LND/05/AQUIS/01-L4.
*ඉඩම් අමාත්‍යාංශයේ යොමු අංකය*: 4/3/16/2019/UDA/179.

සන අපද්‍රව්‍ය කළමනාකරණ ව්‍යාපෘතිය ඇතුළු නාගරික සංවර්ධන කටයුතු සඳහා සිව්වන අදියරය යටතේ ඉඩම් අත්කර ගැනීමට ආණ්ඩුව අදහස් කරන බැව්, 1964 අංක 28 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වන වගන්තියේ (1) වැනි උපවගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

*ලබාගැනීමට බලාපොරොත්තුවන ඉඩම් කැබලිවල විස්තරය*:

වයඹ පළාතේ, පුත්තලම දිස්ත්‍රික්කයේ, වනාතවිල්ලුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක 635/3 සේරක්කුලිය ග්‍රාම නිලධාරි වසමේ සේරක්කුලිය ගමෙහි පිහිටි, පුත්තලම දිස්ත්‍රික් මැනුම් අධිකාරි විසින් 2024.12.30 දිනැතිව සකස් කර ඇති අංක ක.සි. 410058 දරන පිඹුරේ කලාප අංක 01හි පත්‍ර අංක 1හි පහත මායිම් තුළ පිහිටි ඉඩම් කැබලි:

**කැබලි අංකය 2 - ප්‍රමාණය : හෙක් 8.1432.**

මායිම්;
*උතුරට* : මූ.පි.පු. 658හි කැබලි අංක 2 ; *නැගෙනහිරට* : මූ.පි.පු. 5500හි කැබලි අංක 1; *දකුණට* : කැබලි අංක 6 සහ 3; *බටහිරට*: කැබලි අංක 3 සහ 1.

**කැබලි අංකය 3 - ප්‍රමාණය : හෙක් 11.2855.**

මායිම්;
*උතුරට* : කැබලි අංක 1 සහ 2; *නැගෙනහිරට* : කැබලි අංක 2 සහ 6; *දකුණට* : කැබලි අංක 2, 6, 4, 5 සහ මූ.පි.පු. 658හි කැබලි අංක 1; *බටහිරට* : කැබලි අංක 1 සහ 5.

**කැබලි අංකය 5 - ප්‍රමාණය : හෙක් 0.7245.**

මායිම්;
*උතුරට* : කැබලි අංක 3; *නැගෙනහිරට* : කැබලි අංක 3; *දකුණට* : කැබලි අංක 3; *බටහිරට* : කැබලි අංක 1.

**කැබලි අංකය 6 - ප්‍රමාණය : හෙක් 1.0313.**

මායිම්;
*උතුරට* : කැබලි අංක 3 සහ 2; *නැගෙනහිරට* : අ.භූ.පි. 25හි කැබලි අංක 554; *දකුණට* : මූ.පි.පු. 658හි කැබලි අංක 1 සහ මෙම පිඹුරේ කැබලි අංක 3; *බටහිරට* : කැබලි අංක 3 සහ 4.

ඉහත සඳහන් ඉඩම් කැබලිවලට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලු දෙනාම තම තමන් හෝ ඔවුන්ගේ ලියවිලිවලින් බලයලත් අයවළුන් හෝ 2025 ජූලි මස 14 වැනි දින පෙ.ව. 9.30 ට වනාතවිල්ලුව ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී මා සම්මුඛ විය යුතුයි.

තව ද, 2025 ජුනි මස 30 වැනි දිනට හෝ ඊට මත්තෙන් ඒ ඉඩම සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත් එකී ඉඩම ලබාගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත් වන්දි මුදල් හා ඒ මුදල් ගණන් බැලූ හැටිත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම් දිය යුතුයි.

**එස්. එම්. පී. නන්දසේන,**
ප්‍රාදේශීය ලේකම්,
වනාතවිල්ලුව.

2025 මාර්තු මස 15 වැනි දින,
වනාතවිල්ලුව ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

EOG 03 - 0191

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.